ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2014 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை,2014 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2014

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
# வணிகக் கல்வியும் கணக்கீடும் I, II
# Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලු සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

බණ්ඩාර හා සුමනධීර ලී බඩු සාප්පුවක සේවය කළ දෙදෙනෙකි. වඩු කාර්මික ශිල්පියකු වන මොවුන් දෙදෙනා විශ්වාසවන්ත මිතුරන් දෙදෙනෙකි. මොවුන්ට මෙම වැටුප ප්‍රමාණවත් නොවන නිසා මොවුන් වෙනත් ආර්ථික කටයුත්තක නියලීමට බලාපොරොත්තුවෙන් සිටි. බණ්ඩාර ඉතිරිකර ගත් රු. 20,000 මුදලක් මෙම ව්‍යාපාරයට යොදන බව ඔහු සුමනධීරට ප්‍රකාශ කරන ලදි. නමුත් සුමනධීර ලග එලෙස ඉතිරිකරගත් මුදලක් නොමැති නිසා ඔහු පෙරේරා මහතාගෙන් 10% පොලියට රු. 15,000 ක මුදලක් ණයට ගෙන ව්‍යාපාරයට යොදන බව තීරණය කරන ලදි. 2014.01.01 දින මොවුන් සුභ මොහොතින් දේශීය ලී බඩු නිෂ්පාදනයේ ප්‍රමුඛයා වීමේ අභිලාෂය පෙරදැරි කරගෙන හෙළදිව වඩුකාර්මිකයෝ නමින් නව ව්‍යාපාරය ආරම්භ කරන ලදි. එහිදි සුමනධීරගේ මුදලින් රු. 15,000ක් වටිනා ලී කපන යන්ත්‍රයක් මිලදී ගන්නා ලදි.

| | |
|---|---|
| ජනවාරි මාසය තුළ ලී මිලට ගැනීම් | රු. 10,000 |
| විදුලි වියදම් | රු. 1,000 |
| වරිපනම් වියදම් | රු. 2,000 |
| අනෙක් වියදම් | රු. 3,000 |

ජනවාරි මාසයේ ලී බඩු අලෙවි කිරිමෙන් රු. 26,000 උපයා ගැනිමට හැකි විය.

01. මොවුන්ට ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
02. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි වාසි අවාසි එක බැගින් ලියන්න.
03. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද ? එසේ නම් ලියාපදිංචි කළ යුතු පණත හා ආයතනය නම් කරන්න.
04. හෙළදිව වඩු කාර්මිකයෝ ව්‍යාපාරය විසුරුවා හැරිය හැකි ක්‍රම 2ක් සඳහන් කරන්න.
05. ව්‍යාපාර සැලැස්මක් සකස් කිරිමට මොවුන් අදහස් කරයි නම් එහි අන්තර්ගතය කුමක් ද?
06. මෙම ව්‍යාපාරය දියුණුකර ගැනිමට උපකාර වන උපකාරක සේවාවන් 2ක් සඳහන් කරන්න.
07. බණ්ඩාර ට හා සුමනධීරට නව ව්‍යාපාරය ආරම්භ කිරිමට ඇති ප්‍රධානතම ශක්තිය කුමක් ද?
08. හෙළදිව වඩු කාර්මිකයෝ ව්‍යාපාරය සඳහා ඉහත කරුණු සැලකිල්ලට ගෙන සුදුසු දැක්මක් (Vision) නම් කරන්න.
09. 2014.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධනය ගණනය කරන්න.
10. ඉහත ව්‍යාපාරය ලබන ලාභය කොපමණද ?

*(ලකුණු 02 x 10 = 20 යි)*

## I කොටස - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

02. i. පොදුවේ පිළිගත් ආකාරයට නිෂ්පාදනය මූලික වශයෙන් බෙදෙන කොටස් මොනවා ද?

ii. විද්‍යුත් වාණිජ්‍ය (E-Commerce) යනු කුමක්ද?

iii. ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත කරුණු මොනවා ද?

iv. පහත සඳහන් ප්‍රවෘත්තීන් සාර්ව පරිසර සාධක වලට වෙන්කර දක්වන්න.

- ❖ අධික නියගය නිසා උතුරු මැද පලාතේ කුඹුරු අක්කර දහස් ගණනක් විනාශයට පත්වීම
- ❖ වෙළෙඳ පොලේ සහල් මිල ගණන් ඉහළ යාම
- ❖ බෞද්ධාගමිකයින් මාංශ අනුභයෙන් වැලකී සිටීම.
- ❖ ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20 තෙක් ඉහල යාම.

v. පහත දැක්වෙන්නේ යෝගට් නිෂ්පාදන ආයතනයක මාසයකට අදාල තොරතුරු ය. ඒ තුළින් පහත දෑ ගණනය කරන්න.

| | |
|---|---|
| නිෂ්පාදන ඒකක ගණන | 200 |
| ඒකකයක විකුණුම් මිල | රු. 20 |
| වියදම | රු. 400 |

අ. අපේක්ෂිත වාර්ෂික විකුණුම් ආදායම

ආ. අපේක්ෂිත වාර්ෂික ලාභය

(ලකුණු 02 x 05 = 10 යි)

03. i. පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර වල (තනි, හවුල්, සමාගම් වල) දැකිය හැකි පොදු ලක්ෂණ මොනවාද ?

ii. සංස්ථාගත පොදු සමාගමක් හා හවුල් ව්‍යාපාරයක් අතර පහත සඳහන් ලක්ෂණ සමග සැසඳීමක් කරන්න.

1. නීතිමය පුද්ගලභාවය
2. සාමාජික සංඛ්‍යාව

iii. අ. සමන් රු. 200,000 වටිනාකමක් යුතු චෙක්පතක් මහජන බැංකුවේ ජංගම ගිණුමක් හිමි නිමල්ට ලබා දීමට අදහස් කරයි. නමුත් මෙම චෙක්පත නැපල් කිරීමට සමන්ට සිදුවන හෙයින්, එය උපරිම ආරක්ෂාවක් යටතේ නිමල් වෙත ලබා දීමට සමන් අනුගමනය කරන රේඛණය කුමක් ද?

ආ. ඒ වන විට නිමල් තම ජංගම ගිණුම අවලංගු කර තිබුණේ නම්, නිමල් චෙක්පත මුදල් කර ගැනීමට කලයුතු ක්‍රියාමාර්ගය කුමක් ද?

iv. නූතන වෙළෙඳ පොල තුල ගනුදෙනු පියවීම සඳහා යොදා ගත හැකි ගෙවීම් උපකරණ 4ක් නම් කරන්න.

v. අ. "කල්බදු සමාගම" යන්න හඳුන්වන්න.

ආ. වාණිජ බැංකු වලින් ලබා ගත හැකි විදේශ විනිමය ආශ්‍රිත සේවා 2ක් ලියන්න.

(ලකුණු 02 x 05 = 10 යි)

## II කොටස - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

(ප්‍රශ්ණ **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

04. i. ප්‍රාථමික පිරිවැය යනු කුමක් ද?

(ලකුණු 02 යි)

ii. බේකරියක පහත දැක්වෙන පිරිවැය අයිතම, අයත්වන පිරිවැය වර්ගය නම් කරන්න.

- ❖ විදුලිය
- ❖ නිෂ්පාදන සෘජු වැටුප්
- ❖ පිටි
- ❖ මුරකරු වැටුප්

(ලකුණු 02 යි)

iii. නිමි ඇඳුම් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන ලක්ෂාන් ඒ සඳහා ඔහු විසින් සකස් කරන ලද ව්‍යාපාර සැලැස්මෙන් උපුටා ගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

**ඇස්තමේන්තුගත පිරිවැය**

| | |
|---|---|
| රෙදි | 90,000 |
| නූල් හා ඉදි කටු | 25,000 |
| නිමි ඇඳුම් නිර්මාණකරුගේ ගාස්තුව | 10,000 |
| විදුලිය | 5,000 |
| දුරකථන හා වෙනත් වියදම් | 3,000 |
| ගොඩනැගිලි කුලි | 9,000 |
| එක් නිමි ඇඳුමක් මැසීමට කුලිය | 220 |
| නිෂ්පාදිත නිමි ඇඳුම් ගණන | 100 |

අ. ඇස්තමේන්තුගත මාසික මුලු නිෂ්පාදන පිරිවැය සොයන්න.

ආ. මසා නිම කල නිමි ඇඳුමක නිෂ්පාදන පිරිවැය සොයන්න.

ඉ. අපේක්ෂිත ලාභය පිරිවැයෙන් 20% නම් ලක්ෂාන් එක් නිමි ඇඳුමක් විකිණීමට ලකුණු කළ යුතු මිල කීයද ?

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 10 යි)

05. i. මුදල් ප්‍රවාහ ප්‍රකාශය යනු කුමක් ද?

(ලකුණු 02 යි)

ii. පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් මූල්‍ය සැලැස්මක් සකස් කොට කාරක ප්‍රාග්ධනය ගණනය කරන්න.

| | |
|---|---|
| ඉඩම් ගොඩනැගිලි | 350,000 |
| බැංකු අයිරාව | 29,600 |
| ලී බඩු | 80,000 |
| ණයහිමියෝ | 120,800 |
| බඩුතොගය | 90,500 |
| ණයගැතියෝ | 78,100 |
| මුදල් ශේෂය | 15,800 |
| ප්‍රාග්ධනය | 324,000 |
| මෝටර් රථ | 110,000 |
| බැංකු ණය | 250,000 |

(ලකුණු 08 යි)

(මුළු ලකුණු 10 යි)

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර විසින් සම්පාදිත යි.